# ෧. කුරුසියේ වදන් තුළින් ආදර්ශයක්

**කුරුසිපත් වූ ජේසුස් වහන්සේ පැවසූ වදන්වලින් කිහිපයක් ඉගෙන ගැනීමත්, එම වදන් මගින් කිතුනු ජීවිතයට අත්පත් කර ගත හැකි විශේෂ ආදර්ශ සොයාබැලීමත්, මෙම පාඩමින් අපේක්ෂිත ය.**

**ශු. ලූක් 23: 34, ශු. ජොහාන් 19: 26-27, ශු. ජොහාන් 19: 30**



ජේසුස් වහන්සේ කුරුසියේ දී පැවසූ වදන් හතෙන්, තුනක් ගැන අපි ඉගෙන ගනිමු.

> **"පියාණෙනි ඔවුන්ට කමා වුව මැනව. ඔවුන් කරන දේ ඔවුහු නොදනිති."**
> **ශු. ලූක් 23: 34**

මෙය ජේසුස් වහන්සේ කුරුසියේ දී පැවසූ **පළමුවන වචනයයි.** මේ වචනය ඉගෙනීමේ දී පහත සඳහන් කරුණු අපට පැහැදිලි වෙයි.

ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ම තමන්ට හිරිහැර කළ, පීඩා කළ අපහාස කළ සැමට බොහෝ අනුකම්පා කළ සේක. උන්වහන්සේ සේවය කරන විට, ඉගැන්වූ දේ කුරුසියේ දී ක්‍රියාවෙන් ම පෙන්වූ සේක. මෙය කමාව දීමේ උතුම් ම ආදර්ශයයි.

එසේ ම මෙය යාච්ඤාවක් ලෙසින් පියාණන් වහන්සේට ඉදිරිපත් කළ බව පෙනී යයි.

ජේසුස් වහන්සේ උන් වහන්සේට සතුරන් සේ ක්‍රියා කළ අයට කමාව දෙන ලෙස පියාණන් වහන්සේගෙන් ඉල්ලූ සේක.උන් වහන්සේගේ කරුණාභරිත බව මින් මනා ලෙස පිළිබිඹු වෙයි.

ජේසුස් වහන්සේගේ මේ මහඟු ආදර්ශය අනුගමනය **කිරීමට ඔබ සූදානම් ද?**

? ✶ ඔබට වැරදි කරන අයගේ වැරදි අමතක කර දමන්නට.

✶ ඔවුන්ට ප්‍රේමය හා කරුණාව දක්වන ලෙස පියාණන් වහන්සේට ආයාචනා කරන්නට.

✶ ඒ අයට නිරතුරුව ම හදවතින් ම සමාව දෙන්නට

**"ස්ත්‍රිය, මෙන්න ඔබේ පුත්‍රයා"**
**"මෙන්න ඔබේ මෑණියෝ ය"**
**ශු. ජොහාන් 19: 26-27**

මෙය ජේසුස් වහන්සේ කුරුසියේ දී පැවසූ **තුන්වන වචනය යි.**

කුඩා කල පටන් ජෝසෙප්තුමා හා මරියතුමිය සෙවනේ ඇති දැඩි වූ ජේසුස් වහන්සේ ඔවුන්ගේ ආදරය, රැකවරණය ලබමින් ඔවුන්ට කීකරු, යහපත් දරුවකු ලෙස දිවි ගෙවූ බව නිසැක ය. උන් වහන්සේ, කුරුසිය පාමුල වේදනාවෙන් බලා සිටින තම මව වූ මරියතුමිය තමා ප්‍රේම කළ ශ්‍රාවකයා වූ ජොහාන්ගේ රැකවරණයට භාර කිරීම මුළු ලොවට ම දුන් උතුම් ආදර්ශයකි.

මේ තුළින් උන් වහන්සේ දෙමව්පියන් තනි නොකර රැකබලා ගැනීමේ වැදගත්කම ලොවට ම පෙන්වූ සේක.

ඔබේ මවට, පියාට, භාරකරුවන්ට,

? ✶ කීකරු වීම,

? ✶ උපකාරවන්ත වීම,

✶ ප්‍රිය වදනින් කථා කිරීම,

? ✶ ලෙඩ වූ විට ආදරයෙන් රැකබලා ගැනීම,

? ✶ ඔවුන් මුහුණ දෙන ප්‍රශ්නවල දී ඔවුන්ට උදව් වීම.

කිතුනු දරුවන් වන ඔබගෙන් දෙවියන් වහන්සේ බලාපොරොත්තු වන සේක. කුරුසියේ තුන්වන වචනය, සමාජමය ලෙසට අපගේ වගකීම් පිළිබඳ ව අපට මතක් කර දීම ද මෙහි දී දකිමු.

**"සියල්ල නිම විය"**
**ශු. ජොහාන් 19: 30**

මෙය ජේසුස් වහන්සේ කුරුසියේ දී පැවසූ **හයවන වචනයයි.**

අපට භාරවුණ වැඩ හොඳින් නිමා කිරීම, සම්පූර්ණ කිරීම හා සාර්ථක ව අවසන් කිරීම වැදගත් ලෙස සැලකිය යුතු ය. ජේසුස් වහන්සේ සිය මෙහෙය සම්පූර්ණයෙන් ම සාර්ථක ලෙසින් කළ බව කුරුසියේ දී කළ හය වන වදනින් පෙන් වූ සේක.

පියාණන් වහන්සේට කීකරු ව උන් වහන්සේගේ කැමැත්ත අනුව ගැලවීමේ කාර්යය සම්පූර්ණ කළ සේක. කෙතරම් අපහසු වුවත් සිය මෙහෙය උන් වහන්සේ පූර්ණත්වය කරා ගෙන ආ සේක. නොකඩවා යාච්ඤා කිරීමෙන් පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු කිරීමෙන්, පියාණන් වහන්සේගෙන් ධෛර්යය ලැබීමෙන් සියල්ල සාර්ථක ව සම්පූර්ණ කිරීමට උන් වහන්සේ සමත් වූ සේක.

ජේසුස් වහන්සේ කුරුසියේ දී පැවසූ හය වන වදනින් සවිමත් වන අප

✶ මට භාරවන කාර්යයන් යාච්ඤාවෙන් යුතු ව මම දෙවිඳුන් අතට භාර කරමි.

✶ දේව වදනින් සවිය ලබා එම කාර්ය ඉටු කිරීමට කැප වෙමි.

✶ මට ඉටු කිරීමට ඇති සියලු කාර්ය මම සම්පූර්ණයෙන් සාර්ථක ව නිම කිරීමට උත්සාහ කරමි.

✶ සියල්ල සම්පූර්ණ කළ පසු මම දෙවිඳුන්ට ඒ ගැන පැසසුම් පුදමි.

කිතුනු දරුවන් ලෙස අධ්‍යාපනය සාර්ථක ව නිමා කරන්නට මෙන් ම ජීවිතයේ අපට භාරවන ඕනෑම කාර්යයක් නිවැරදි ව හා සාර්ථක ව නිම කිරීමට ජේසුස් වහන්සේ දිනපතා අපට මග පෙන්වන සේක.

## ක්‍රියාකාරකම

1) ජේසුස් වහන්සේ කුරුසියේ දී පැවසූ වදන් තුළින් ඔබ ඉගෙන ගත් කරුණු 3ක් ලියා දක්වන්න.

2) ඔබට වැරදි කරන අයට සමාව යදිමින් කරන යාච්ඤාවක් රචනා කරන්න.

3) ජේසුස් වහන්සේ කුරුසියේ දී ලබා දුන් ආදර්ශය තුළින් 'අපේ මව්පියන් වෙනුවෙන් අපට කළ හැකි දේ' යන මැයින් වාක්‍ය කිහිපයක් ලියන්න.